ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනවේදී (විශේෂ අවශ්‍යතා අධ්‍යාපන)උපාධි වැඩසටහන 2020/2021

6 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2021

අන්තර්කරණ පන්ති කාමරවල සිටින සිසුන් සඳහා විෂයමාලා සංවර්ධනය - සහ අනුවර්තනය - SNE6546/ESE6246

කාලය පැය තුනයි. (03)

---

දිනය - 2021.07.25 වේලාව -ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

**1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

<u>1 වන කොටස</u>

01. විධිමත් විෂයමාලාවට අදාළ අංශ තුනක් (03) කෙටියෙන් පැහැදිලි කරන්න.

02. ඉඩ සැලසීම සහ විෂයමාලා නවීකරණය අතර ඇති වෙනස්කම් පැහැදිලි කරන්න.

03. විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත ළමයෙකුට කාර්යක් ඉටු කිරීමට කාලය ලබා දීම සඳහා ඉඩ සැලසීම් සිදු කරන්නේ කෙසේ ද?

04. විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත ළමයින් සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී විශ්වීය ආකෘතියේ බලපෑම පරීක්ෂා කරන්න.

05. පන්ති කාමරය තුළ ළමයින්ගේ ඉගෙනීම සඳහා සූදානම් මට්ටම පිළිබඳ ගුරුවරයෙකු වශයෙන් ඔබ අවබෝධ කර ගන්නේ කෙසේ ද?

06. ඉගැන්වීම විවිධාංගීකරණයට අනුව ඔබ ක්‍රියාවලිය විවිධාංගීකරණය කරන්නේ කෙසේ ද?

07. බ්ලූම්ගේ අරමුණු ධූරාවලියට අනුව ඉහළ මට්ටමේ ප්‍රජානන කුසලතා තුනක් (03) ලැයිස්තු ගත කර එම ඕනෑම ප්‍රජානන කුසලතා දෙකකට (02) අදාළව ප්‍රශ්න දෙකක් (02) සකස් කරන්න.

08. විශේෂ අධ්‍යාපනික අවශ්‍යතා සහිත ළමයින් සඳහා භාවිත කළ හැකි තාක්ෂණික මෙවලම් තුනක් (03) එහි අරමුණුත් සමඟ දක්වන්න. (ලකුණු 5 X 8 = 40)

## 2 වන කොටස

09. I. හොවාඩ් ගාඩ්නර් ඉදිරිපත් කරන ලද බහුවිධ බුද්ධියට අදාල ප්‍රවර්ග පහක් **(05)** දක්වන්න. (ලකුණු 05)

II. ඉගැන්වීම විවිධාංගීකරණය සඳහා බහුවිධ බුද්ධි න්‍යායේ බලපෑම පරීක්ෂා කරන්න. (ලකුණු 05)

III. බහුවිධ බුද්ධියට අදාළ ප්‍රවර්ග තුනක් **(03)** තෝරාගෙන අන්තර්කරණ පන්ති කාමරයක් තුළ ඔබ ඒවා භාවිතා කරන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)

10. I. ඉගැන්වීම විවිධාංගීකරණයට අනුව නිමැවුම යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 04)

II. සිසුන්ගේ ඉගෙනීම මත නිවැවුම විවිධාංගීකරණය නොකිරීමේ ප්‍රතිවිපාක දෙකක් උදාහරණ ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

III. පන්ති කාමරය තුළ ඔබ උගන්වන විෂයක් තෝරා ගන්න. එම පාඩමට අදාළව ඔබ නිමැවුම විවිධාංගීකරණය කරන්නේ කෙසේ ද? (ලකුණු 10)

11. I. විශේෂ අධ්‍යාපනික අවශ්‍යතා සහිත ළමයින්ට අධ්‍යාපනය ලබා දීමේ දී ඉගෙනීම සඳහා විශ්වීය ආකෘතියේ වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 10)

II. ඉගෙනීම සඳහා විශ්වීය ආකෘතිය ක්‍රියාත්මක කිරීමේ දී ශ්‍රී ලංකාවේ පාසල් තුළ දක්නට ලැබෙන 'අවස්ථා' සහ 'බාධක' මොනවා ද? (ලකුණු 10)

12. 'අන්තර්කරණ අධ්‍යාපන සංකල්පයට අනුව විශේෂ අධ්‍යාපනික අවශ්‍යතා සහිත සිසුන්ට සාමාන්‍ය විෂයමාලාව යටතේ අධ්‍යාපනය ලබා දිය යුතුය.'

I. සාමාන්‍ය විෂය මාලාවට කිසිදු වෙනස්කමක් නොකර එය විශේෂ අධ්‍යාපනික අවශ්‍යතා සහිත ළමයින් වෙනුවෙන් භාවිත කිරීමේ ප්‍රතිවිපාක මොනවා ද? (ලකුණු 08)

II. සාමාන්‍ය පන්ති කාමරවල සිටින විශේෂ අධ්‍යාපනික අවශ්‍යතා සහිත ළමයින්ට විෂයමාලාවේ ඉඩ සැලසීම හා සංශෝධනය සිදු කිරීමේ වැදගත්කම උදාහරණ සහිතව සනාථ කරන්න. (ලකුණු 12)

13. ඉගෙනීම තුළ සාමාන්‍ය හැකියාවන් ඇති නමුත් දිගු කාලයක් තුළ අවධානය පවත්වා ගැනීම සම්බන්ධ සුවිශේෂී සීමාකම් පෙන්වන ළමයෙක් ඇත.

I. ළමයාගේ ස්වභාවය අනුව උපදෙස් මට්ටම් තුළ වෙනසක් සිදු කිරීම අවශ්‍ය යැයි ඔබ හිතන්නේ ද? ඔබගේ පිළිතුරට හේතු දක්වන්න. (ලකුණු 10)

II. ළමයාගේ ස්වාභාවය අනුව ඔබ තක්සේරුකරණය අනුවර්තනය කරන්නේ කෙසේ ද? සුදුසු උදාහරණ ලබා දෙන්න. (ලකුණු 10)

14. I. ඉගෙනීම පිළිබඳ විශ්වීය ආකෘතියේ මූලධර්ම තුන **(03)** පැහැදිලි කරන්න. (ලකුණු 10)

II. ඉගෙනීම පිළිබඳ විශ්වීය ආකෘතිතයේ පවතින මූලධර්ම තුන **(03)** සහ මොළයේ ජාල තුන **(03)** අතර සම්බන්ධතාවය පරීක්ෂා කරන්න. (ලකුණු 10)

හිමිකම් ඇවිරිණි.